31.03.2016

ද මැසිනොද් විදුහල කඳාන

**De Mazenod College - Kandana**

# නර්තනය

පැය 2

Learning Resource Center
De Mazenod College
Kandana

පළමු වාර පරීක්ෂණය 2016

9 ශ්‍රේණිය

*නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.*

01) කල භාවිතයේදි මණ්ඩියට සිටීම අයත් වන්නේ,
   a. මැද තලය
   b. ඉහල තලය
   c. පහල තලය
   d. පසු තලය

02) මාත්‍රා 2 සරල කව්තාල කවි පදයකි,
   a. සිරිවස ගෙන අසු නැගෙමින්
   b. සමන වෙමින් විනා
   c. ඉන්ද්‍ර දිහාවට ඉඹුල් විමනට
   d. මින් තුන් ලොව සැම

03) මාත්‍රා 3 / 4 දෙතිතේ තාලයට අයත් බෙර පදයක් වන්නේ,
   a. පරගුඳ ගතත් දොම්
   b. ගුං ගුඳ ගුංගුඳ ගුඳං ගුඳං ගත
   c. දෝං ගතා කුද
   d. ගුංඳ ගුඳංගත ගත්තත් දහිං දිනගත

04) මාත්‍රා 3/3/ තනි තිතට අයත් බෙර පදයක් වන්නේ,
   a. ගුංද දෙගත ගදිගත ගුඳ
   b. රෙගුං ගුඳංගත් දෙගත් ගතකු දොං
   c. දෙගත් ගතකු දොං
   d. ගුං ගුඳ ගුං ගුඳ

05) තනි තිතේ තාල රූප ගණන.
   a. 5කි
   b. 4කි
   c. 3කි
   d. 2කි

06) රිද්මායනුකූළ චලන ඉදිරිපත් කිරිමේදී.
   a. තාලය මූලික වේ
   b. රිද්මයානුකූල ලක්ෂණ මූලික වේ
   c. ප්‍රකාශනය මූලික වේ
   d. තාලය හා ප්‍රකාශනය මූලික වේ.

07) අනුරාධපුර යුගය නර්තන කලාව පිළිබඳ සඳහන් ලිඛිත මූලාශ්‍ර වන්නේ,
   a. මහාවංශය, දීපවංශය
   b. පන්සිය පණස් ජාතකය, දීපවංශය
   c. හිංස සංදේශය, මහා වංශය
   d. පන්සිය පණස් ජාතකය, හංස සංදේශය

08) සබරගමු නැටුම් කලාවේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වන්නේ,
   a. දවුල
   b. තමමැට්ටම

c. යක් බෙරය
d. ගැට බෙරය

09) දුටු ගැමුණු රජු රුවන්වැලි සෑය බඳින උත්සයට නළගනන් ................ පිරිවරා ගිය බව සඳහන්වේ.
a. 15000
b. 6000
c. 16000
d. 12000

10) අවකාශයෙහි දිශා ගණන,
a. 8කි
b. 10කි
c. 12කි
d. 14කි

11) කලානුකූල චලන නිර්මාණයකට සුදුසු ගීතයකි.
a. අක්කේ අක්කේ අර බලන්නකෝ
b. මීහි මඬලේ අඳුරු කුසේ
c. දෑතට වලලු
d. රෑ වැඩ මුරය

12) දෙවොල් මඩු ශාන්ති කර්මයේ පූර්ව චාරිත්‍රයකි.
a. හගල සෑදීම
b. ගුරුගේ මාලාව
c. තෙල්මේ නැටීම
d. මඩු පේ කිරීම

## II කොටස

ප්‍රශ්න 4කට පමණක් පිළිතුරු සපයන්න.

01)
1 අනුරාධපුර යුගයට අයත් ලෙන් ලිපි 2ක් නම් කරන්න.
2 අනුරාධපුර යුගයේ නර්තන කලාව පැවති බවට මූලාශ්‍ර ඇසුරින් සාධක 2ක් සපයන්න.
3 ඉහත සාධක ඇසුරින් එකල නර්තන කලාව පැවති තත්වය පිළිබඳ විස්තර කරන්න.

02)
1 මැඳුම් තනිතිතට අයත් රබන් පදයක් ප්‍රස්ථාර කරන්න.
2 තනි තිතට අයත් කවියක් ප්‍රස්තාර කරන්න.
3 මහ තනි තිතට අයත් ඉරට්ටියක් ප්‍රස්තාර කරන්න.

03) පහත සඳහන් මාතෘකා තුනක් තෝරගෙන කෙටි සටහන් ලියන්න.
1 අවකාශය භාවිතය
2 මණ්ඩිය
3 සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ
4 ඉලංගම් සරඹ
5 මහනුවර ඇසල පෙරහැර
6 ඉරට්ටිය

04)
1 පා සරඹ පුහුණු වීමේ වැදගත්කම පහදන්න.
2 නමස්කාර පදය ලියන්න.
3 දෙවන ඉලංගම් සරඹයේ පදය හා ඉරට්ටිය ලියන්න.

05)
1 සතර අභිනය නම් කරන්න.
2 ඉන් එකක් පිළිබඳ විස්තර කරන්න.
3 සතර අභිනය යොදාගනිමින් ඉදිරිපත් කළ ප්‍රසංගයක් පිළිබඳ කෙටි සටහනක් පිළියෙල කරන්න.